# දිව්‍ය සත්ප්‍රසාද මංගලෝත්සවය | දේව ප්‍රකාශන

07-06-15

## පළමුවන දේව ප්‍රකාශනය

නික්මයාම 24:3-8

නික්මයාම පොතෙන් උපුටා ගත් කොටසකි.

**("මෙය වනාහි සමිඳුණන් වහන්සේ ඔබ සමග කළ ගිවිසුම ස්ථිර කරන රුධිරය වේ.")**

මෝසෙස් ද ඇවිත් සමිඳුණන් වහන්සේගේ සියලු ආඥා හා නියෝග සෙනඟට දැන්වී ය. සියලු සෙනඟ ද එක හඬින් උත්තර දෙමින්, "සමිඳුණන් වහන්සේගේ ආඥා සියල්ල ම අපි ඉටු කරන්නෙමු." යි කීහ. ඉන්පසු ඔහු උන් වහන්සේගේ ආඥා සියල්ල ම ලියා තැබීය. පසුදින උදය අලුයම ඔහු නැඟිට කන්ද, පාමුල පූජාසනයක් ද ඉශ්රායෙල් ගෝත්‍ර දෙළොස අනුව ශිලාස්ථම්භ දෙළොසක් ද ඉදි කළේ ය. පසුව ඔහු ඉශ්රායෙල් ජනයා අතරෙන් තරුණයන් යැවී ය. ඔව්හු දවන යාග පූජා හා ගවයන් මරා, සහභාගිකමේ පූජා ද සමිඳුණන් වහන්සේට ඔප්පු කළහ. මෝසෙස් සතුන්ගේ ලෙයින් දෙකෙන් කොටසක් ගෙන එය බඳුන්වල දමී ය. ලෙයින් අඩක් පූජාසනය මත ඉස්සේය. පසුව ඔහු ගිවිසුම් පොත රැගෙන සෙනඟට ඇසෙන ලෙස එය කියවී ය. ඔව්හු ද පිළිතුරු දෙමින් "සමිඳුණන් වහන්සේ වදාළ සියල්ල ම අපි ඉටු කරන්නෙමු." යි කීහ. එවිට මෝසෙස් ලේ රැගෙන, සෙනඟ මත ඉසිමින් "මේ වනාහි සමිඳුණන් වහන්සේ මෙකී ආඥා ඔබට දෙමින්, ඔබ සමග කළ ගිවිසුම ස්ථිර කරන ලේ ය." යි පවසී ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 116:12-13,15-18

පිළිතුර: මම ගැළවීමේ කුසලාන ගෙන සමිඳුන්ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි.

ගීය: සමිඳුන් මා හට කළ සියලු යහපත්කම් ගැන එතුමන්ට මම කුමක් පුදම් ද? මම ගැළවීමේ කුසලාන ගන්නෙමි. සමිඳුන්ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි.

සැදැහැවතුන්ගේ මරණය සමිඳුන් අබියස අගනේය. සමිඳුනි, මම ඔබේ මෙහෙකරුවෙක් වෙමි. සැබැවින්ම ඔබේ මෙහෙකරුවෙක් වෙමි. ඔබේ දාසියගේ පුත්‍රයා වෙමි. ඔබ මාගේ බැඳුම් මිදූ සේක.

මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි. සමිඳුන්ගේ නාමය අමතා අයදින්නෙමි. එසේය සමිඳුන්ගේ මුළු සෙනඟ ඉදිරියේ මාගේ බාර හාර ඉටු කරන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය

හෙබ්‍රෙව් 9:11-15

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**(ක්‍රිස්තුස් වහන්සෙගේ සිරි ලෙයින් ඔබේ හෘදය සාක්ෂිය පිරිසිදු කරන ලබන්නේ ය.)**

එහෙත් ක්‍රිස්තුන් වහන්සේ දැනට ම ඇති යහපත් දේ පිළිබඳ උත්තම පූජකයාණන් වශයෙන් පැමිණිවිට, උන් වහන්සේ වඩා උතුම් හා වඩා සම්පූර්ණ, මිනිස් අතින් නොසෑදූ, එනම්, මේ භෞතික මැවිල්ලට අයිති නොවන මණ්ඩපය මැදින් වැඩිය සේක. උන් වහන්සේ එළුවන්ගේත්, වස්සන්ගේත් ලෙයින් නොව, තමන්ගේ ම ලෙයින් අප උදෙසා සදාතන විමුක්තිය ලබා සදහට ම එක වරක් ශුද්ධස්ථානයට ඇතුළු වූ සේක. මන්ද, චාරිත්‍ර අනුව අපවිත්‍ර යයි සලකන අය මත එළුවන්ගේත්, ගොනුන්ගේත් ලේ ද, එළ වැස්සියකගේ අළු ද ඉසීමෙන්, ඔව්හු පාරිශුද්ධිය

ලබන්නාහු ය. එසේ නම්, ජීවමාන දෙවියන් වහන්සේට සේවය කරන පිණිස ඔබගේ හෘදය සාක්ෂිය නිෂ්ඵල ක්‍රියාවලින් පිරිසිදු කරනු ලැබීම, සදාතන ආත්මයාණන් මගින් තමන් ම කැළලක් නැති ව දෙවියන් වහන්සේට පූජා වූ, ක්‍රිස්තුන් වහන්සේගේ ලේ කරණකොටගෙන, ඊටත් ඉතා වැඩියෙන් පිරිසිදු නොවන්නේ ද? මේ කාරණය නිසා, කැඳවනු ලැබූවන්ට සදාතන උරුමයේ පොරොන්දුව ලැබෙන පිණිස උන් වහන්සේ අලුත් ගිවිසුමක මැදහත් කාරයාණෝ වන සේක. එසේ වන්නේ පළමු වන ගිවිසුමේ කාලයේ දී කළ පාප ක්‍රියාවලින් මුදනු ලැබීම පිණිස මරණයක් සිදු වූ බැවිනි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## <u>සුපුවත් ජය නද</u>

ජුවාම් 6:51

ආලේලූයා! ආලේලූයා!
"ස්වර්ගයෙන් පහළවන ජීවන දායක භෝජනය මම ය. යමෙක් මේ භෝජනය වැළඳුවොත් ඔහු සදාකල් ජීවත් වන්නේ ය." යි ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

## <u>ශුද්ධවූ සුවිශේෂය</u>

මාක් 14:12-15, 22-26

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"මෙය මාගේ ශරීරය ය. මෙය මාගේ රුධිරය ය."**

පාස්කු බැටළු පෝතකයා පූජා කරනු ලබන, නුමුහුන් රොටි මංගල්‍යයේ පළමු වන දින උන් වහන්සේගේ ශ්‍රාවකයෝ, "පාස්කු භෝජනය වළඳන පිණිස අප ගොස් කොතැන පිළියෙළ කරනවාට ඔබ කැමැති සේක් දැ"යි උන් වහන්සේගෙන් ඇසූ හ. එවිට උන් වහන්සේ තම ශ්‍රාවකයන් දෙදෙනෙකු යවමින්, "නුවරට යන්න; ගිය විට, වතුර කළයක් ගෙන යන මිනිසෙක් ඔබට හමු වන්නේ ය; ඔහු පස්සේ යන්න. ඔහු යම් ගෙදරකට ඇතුළු වන්නේ ද ඒ ගෙහිමියාට කතා කොට, 'මාගේ ශ්‍රාවකයන් සමඟ පාස්කු භෝජනය වළඳන පිණිස මට වෙන් කළ කාමරය කොයි ද කියා සමිඳාණන් වහන්සේ අසන සේකැ'යි කියන්න. එවිට සකස් කොට සූදානම් ව ඇති ලොකු උඩුමහල් කාමරයක් ඔහු ඔබට පෙන්වනු ඇත. එහි අපට පාස්කු භෝජනය පිළියෙළ කරන්නැ"යි ඔවුන්ට වදාළ සේක. ඔවුන් ආහාර වළඳමින් සිටිය දී උන් වහන්සේ රොටි ගෙන, ආශීර්වාදය පවසා, ඒවා කඩා ඔවුන්ට දී, "ගන්න, මේ මාගේ ශරීරය ය"යි වදාළ සේක. උන් වහන්සේ කුසලානක් ද ගෙන, තුති පුදා, ඔවුන්ට දුන් සේක. සියල්ලෝම එයින් පානය කළහ. තවද උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "මෙය බොහෝ දෙනා වෙනුවෙන් වගුරුවනු ලබන මාගේ ගිවිසුම්-රුධිරය වේ. සැබැවින් ම මම ඔබට කියමි, දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි දී මම නැවත මිදියුස පානය කරන දිනය එන තෙක්, මම මේ මිදියුස යළිත් පානය නොකරන්නෙමි"යි වදාළ සේක. ඔව්හු ගීතයක් ගයා ඔලීව කන්දට නික්ම ගියහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.